// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1713/3 – 2011 ජූලි 04 වැනි සඳුදා – 2011.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුවර ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2009.06.29 දිනැතිව කේජ්එම්අයිඑල්එල්/09/322 අංක දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.2354ක් පමණ වන කැබලි අක්ෂර 'ඒ', 'බී' හා 'සී' වශයෙන් සඳහන් කර ඇති ඉඩම් කොටස් තුනට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ගොරකගහගොඩැල්ල *නොහොත්* **හලාගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0775ක් පමණ**

උතුරට: ඕ. හේමචන්ද්‍ර සහ තවත් අය හිමිකම් කියන බලුවලකුඹුර; නැගෙනහිරට: ඕ. හේමචන්ද්‍ර සහ තවත් අය හිමිකම් කියන බලුවලකුඹුර සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී; දකුණට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී, උඩුවර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය සහ කැලුම් ප්‍රිය දීපාල් හිමිකම් කියන ගොරකගහගොඩැල්ල; බටහිරට: උඩුවර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය සහ කැලුම් ප්‍රිය දීපාල් හිමිකම් කියන ගොරකගහගොඩැල්ල සහ ඕ. හේමචන්ද්‍ර සහ තවත් අය හිමිකම් කියන බලුවලකුඹුර.

02. කැබලි අක්ෂර 'බී' – ගොරකගහගොඩැල්ල *නොහොත්* **හලාගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1168ක් පමණ**

උතුරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, ඕ. හේමචන්ද්‍ර සහ තවත් අය හිමිකම් කියන බලුවලකුඹුර; නැගෙනහිරට: ඕ. හේමචන්ද්‍ර සහ තවත් අය හිමිකම් කියන බලුවලකුඹුර, ජී. ලයනල් ද සිල්වා හිමිකම් කියන දොඹගහලියැද්ද සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී; දකුණට: ජී. ලයනල් ද සිල්වා හිමිකම් කියන දොඹගහලියැද්ද සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී සහ උඩුවර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය; බටහිරට: උඩුවර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ.

03. කැබලි අක්ෂර 'සී' – ගොරකගහගොඩැල්ල *නොහොත්* **හලාගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0411ක් පමණ**

උතුරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී සහ ජී. ලයනල් ද සිල්වා හිමිකම් කියන දොඹගහලියැද්ද ; නැගෙනහිරට: ජී. ලයනල් ද සිල්වා හිමිකම් කියන දොඹගහලියැද්ද සහ මහාමාර්ගය; දකුණට: මහාමාර්ගය සහ උඩුවර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය; බටහිරට: උඩුවර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2009/ඒ/61.
ප්‍රාදේශිය ලේකම්ගේ යොමු අංකය: මිල්/ඉ4/2/74.
2011 ජූනි මස 29 වැනි දින,
අංක 80/5,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 447

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

යොමු අංකය: 4/3/1/119

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගෙදර ඉඳිගස්තුඩුව ගම් වල පිහිටි, මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කේජ්/එම්ටීජී/2008/34 සහ 2008.05.09 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.8700ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුත් ඉඩම් කොටස් මායිම් සඳහා ප්‍රසිද්ධ කර ඇති අංක 1685/19 හා 2010.12.23 දිනැති ඉංග්‍රිසි ගැසට් පත්‍රයේ සඳහන් ගම සහ ප්‍රගමන අනුරේඛණ අංකය අතපසු වීමකින් වැරදි ලෙස ඉංග්‍රිසි ගැසට් පත්‍රයේ මුද්‍රණය වී ඇත. එය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගොඩ කටුකුරුන්ද ගම් වල පිහිටි, මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කේඑල්ටී/07/647 සහ 2008.03.28 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0559ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුත් ඉඩම් කොටස් වලට මායිම්.

සිරිසෝම ලොකුවිතාන,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2011 ජුනි මස 29 වැනි දින,
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

07 - 382

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.